සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

දෙවන වාර පරීක්ෂණය 2017
மூன்றாம் தவணைப் பரீட்சை 2017
**Second Term Test 2017**

11 ශ්‍රේණිය
தரம்11
**Grade 11**

ඉතිහාසය I
History **I**

පැය 1 යි
Three hours

**සැලකිය යුතුයි.**

★ **ප්‍රශ්න සියල්ලටම නිවැරදි පිළිතුරු සපයන්න.**

(01) ශ්‍රී ලංකාවේ ප්‍රධානතම සාහිත්‍ය මූලාශ්‍රය ලෙස සැලකෙන මහාවංශය රචනා කරන ලද්දේ,

1. කුපික්කලතිස්ස හිමි
2. මහානාම හිමි
3. බුද්ධ ඝෝෂ හිමි
4. උත්තිය හිමි

(02) මෙරට පූර්ව ඓතිහාසික යුගයේ ශිලා සුසානයකට උදාහරණයක් වනුයේ,

1. රංචාමඩම
2. පාහියංගල
3. ඉබ්බන්කටුව
4. මිනිහාගල්කන්ද

(03) පූර්ව ඓතිහාසික යුගය හැඳින් වූ තවත් නමක් පහත ප්‍රකාශ අතුරින් තෝරන්න.

1. ගල් යුගය
2. මුල් යකඩ යුගය
3. එඬේර යුගය
4. හොලෝසීන යුගය

(04) පැරණි සෙල්ලිපිවල ''පරුමක'' යනුවෙන් හඳුන්වා ඇත්තේ,

1. පවුලක ප්‍රධානියයි
2. ප්‍රභුවරයායි
3. ගෝත්‍රයක ප්‍රධානියයි
4. ගමක ප්‍රධානියයි

(05) අතීතයේ වැව් පද්ධතිය ගැමියන් හඳුන්වා ඇති නම වන්නේ,

1. වැව් ගම යන නමිනි
2. වැව් ප්‍රපතනය නමිනි
3. එල්ලංගාව නමිනි
4. වාරි පද්ධතිය නමිනි

(06) අතීතයේ ප්‍රාදේශීය පාලකයා හැඳින් වූ නම වන්නේ,

1. මධුපාචිකා
2. පරුමකලු
3. පොචනි රජ
4. අග්‍ර මහේෂිකා

(07) ප්‍රථම වතාවට අනුරාධපුයේ නැගෙනහිර හා බටහිර ප්‍රදේශ එක්සත් කර අනුරාධපුරයේ බලයට පත් වූ රජතුමා,

1. මුටසීව රජුය
2. දේවානම්පියතිස්ස රජු
3. පණ්ඩුකාභය රජුය
4. විජය රජුය

(08) වසභ රජුගේ කාලයේ යාපනය ප්‍රදේශය හැඳින්වූයේ,

1. මලය රට
2. වන්නි ප්‍රදේශ
3. දක්ඛිණ දේශය
4. නකදිව

(09) ශ්‍රී මහා බෝධිය මෙරටට වැඩමවන විට මෙරට සිටි පාලකයා වන්නේ,

1. පණ්ඩුකාභය රජතුමාය
2. දුටුගැමුණු රජතුමාය
3. දෙවනපෑතිස් රජුය
4. කාවන්තිස්ස රජුය

(10) සෙල්ලිපිවල ''අලකපය මහරජ'' යනුවෙන් හඳුන්වා දී ඇති රජතුමා,

1. වලගම්බා රජතුමාය
2. ගජබා රජතුමාය
3. පළමුවන කාශ්‍යප රජතුමාය
4. තුන්වන උදය රජතුමාය

(11) පළමුවන පරාක්‍රමබාහු රජතුමා උපන් ග්‍රාමය හඳුන්වනු ලැබුවේ,

1. අනුරාධපුරය නමිනි
2. පුලස්තිගාම නමිනි
3. මහාගාම නමිනි
4. පුංඛගාම නමිනි

(12) වසභ රාජ්‍ය සමයේ නාගදීපය පාලනය කළ ඎෂිගිරි ඇමතියා පිළිබඳව සඳහන්ව ඇත්තේ,

1. වල්ලිපුරම් රන්පතෙහිය
2. පනාකඩුව තඹ සන්නසේ ය
3. කෝන්ගල සෙල්ලිපියේ ය
4. මිහින්තලා පුවරු ලිපියේ ය.

(13) පළමු වන උපතිස්ස රජතුමා ගැබිනි මව්වරුන්ගේ අවශ්‍යතා සඳහා ඉදිකළ මාතෘ නිවාස හැඳින් වූ නම වන්නේ,

1. සොත්තිශාලා
2. සිවිකාසාලා
3. පසවන්ති නාමශාලා
4. වෙජ්ජසාලා

(14) විශාල වැවක අතිරික්ත ජලයෙන් වැව් බැම්මට වන හානිය අවම කර ගැනීම සඳහා පැරණි වාරි ශිල්පීන් යොදාගත් තාක්ෂණික උපක්‍රමය වූයේ,

1. පිටවාන
2. ඇතුළුවාන
3. ගොඩ සොරොව්ව
4. මඩ සොරොව්ව

(15) ඓතිහාසික මූලාශ්‍රවල ''වජ්‍ර චුම්භට'' යනුවෙන් හඳුන්වා ඇත්තේ,

1. අකුණු සන්නායකයි
2. ශක්තිමත් පාදමයි
3. චක්‍රාකාර පියස්සයි
4. වටදාගෙයි

(16) අතීතයේ ''ලාහ'' වශයෙන් හැඳින්වූයේ,

1. දුර මැනීමේ ඒකකයකි.
2. කාලය මැනීමේ ඒකකයකි
3. බර මැනීමේ ඒකකයකි
4. අවකාශය මැනීමේ ඒකකයකි.

(17) කෑගල්ල දිස්ත්‍රික්කයේ දූදිගම කොටවෙහෙරෙන් සොයාගන්නා ලද ඇත් පහන නිර්මාණය සඳහා යොදා ගෙන ඇති ලෝහය වන්නේ,

1. රන් ය
2. රිදී ය
3. පිත්තල ය
4. ලෝකඩ ය

(18) අතීතයේ සෙල්ලිපිවල රජුට සමීපතම නිලධාරීන්ව හඳුන්වා ඇත්තේ,

1. රද්කොල් සමිදරු
2. පරුමක
3. අන්තේවාසික
4. දසගම් ඇත්තෝ

(19) අතීතයේ බදු නීතිය යටතේ වැව්වල ජලය භාවිත කරන්නන්ගෙන් අයකළ බද්ද හැඳින්වූයේ,

1. බොජකපති නමිනි
2. දකපති
3. කැති අඩ
4. මකරමජ්ඣික

(20) ශ්‍රී ලංකාවේ පැරණි නගර පරිහානියට බල පෑ හේතු ඇතුළත් පිළිතුර වන්නේ,

A මධ්‍යගත පාලනය බිඳ වැටීම

B සාසනය පිරිහී යාම

C ජනතාව වෙනත් ප්‍රදේශවලට සංක්‍රමණය වීම

D නගර පාලකයින් අල්ලස් ලබා ගැනීම

1. AC
2. AD
3. BC
4. CD

(21) දඹදෙනි රාජ්‍ය පාලනය මෙහෙය වූ ''කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත'' නමින් හැඳින්වූ පාලකයා වන්නේ,

1. පළමුවන පරාක්‍රමබාහු
2. දෙවන විජයබාහු
3. දෙවන පරාක්‍රමබාහු
4. හයවන පරාක්‍රමබාහු

(22) යාපහුවේ රාජ්‍ය පාලනය කළ පළමුවන බුවනෙකබාහු රජු වෙළඳ සබඳතා තර කර ගැනීමට තානාපති වරුන් යවනු ලැබූ රට වන්නේ,

1. ඉන්දියාව
2. චීනය
3. ඊජිප්තුව
4. රෝමය

(23) ගම්පොල රාජධානි සමයේ මෙරටට පැමිනි අරාබි දේශගවේශකයා වන්නේ,

1. අබුසයිද්ය
2. පාහියන් හිමිය
3. ඉබන් බතුතා ය
4. අල් බල්ශුරි

(24) කෝට්ටේ රජ්‍ය සමයේ ලංකාව එක්සේසත් කළ හයවන පරාක්‍රමබාහු රජු යාපනය ජය ගැනීමට යැවූ සෙන්පතියා වනුයේ,

1. අම්බුලුගල කුමරු
2. සපුමල් කුමරු
3. කිත්ති කුමරු
4. ටිකිරි කුමරු

(25)

| කෘතිය | කතුවරයා |
|---|---|
| A. කව්සිළුමිණ | E. තොටගමුවේ ශ්‍රී රාහුල හිමි |
| B. සද්ධර්ම රත්නාවලිය | F. බුද්ධපුත්‍ර හිමි |
| C. පූජාවලිය | G. ධර්මසේන හිමි |
| D. සැළලිහිණි සංදේශය | H. දෙවන පරාක්‍රමබාහු රජු |

ඉහත තොරතුරුවලට අනුව නිවැරදි පිළිතුර තෝරන්න.

1. HGFE
2. EGHF
3. FGHE
4. HFEG

(26) මහනුවර රාජධානියේ ආරම්භක පාලකයා ලෙස සැලකෙන්නේ,

1. පළවන විමලධර්මසූරිය රජු
2. කීර්ති ශ්‍රී රාජසිංහ රජු
3. සේනා සම්මත වික්‍රමබාහු රජු
4. සෙනරත් රජු

(27) උඩරට පාලකයෙකු වූ පළවන විමලධර්මසූරිය රජු සම්බන්ධ නිවැරදි ප්‍රකාශය ඇතුළත් වරණය තෝරන්න.

A කුසුමාසන දේවිය විවාහ කර ගැනීම

B ලන්දේසීන් සමඟ ගිවිසුමක් ඇති කර ගැනීම

C දන්තුරේ සටහන් පරාජයට පත්වීම

D දන්ත ධාතුන් වහන්සේ උඩරටට වැඩමවීම

1. AD
2. BD
3. BC
4. BD

(28) 1638 දී පෘතුගීසීන් මෙරටින් පන්නා දැමීම සඳහා දෙවන රාජසිංහ රජු ගිවිසුමක් ඇතිකරගත් බටහිර ජාතිය නම්,

1. ප්‍රංශ
2. ඉංග්‍රීසි
3. ලන්දේසි
4. ස්පාඤ්ඤ

(29) ලන්දේසින් විසින් එවන ලද ලිපිවල ''ත්‍රිසිංහලාධීශ්වර'' යනුවෙන් හැඳින්වූ උඩරට රජතුමා වන්නේ,

1. පළමුවන විමලධර්සූරිය රජු
2. දෙවන රාජසිංහ රජු
3. කීර්ති ශ්‍රී රාජසිංහ රජු
4. රාජාධිරාජසිංහ රජු

(30) මුත්තුසාමි වෙනුවට කන්නසාමි කුමරු ''ශ්‍රී වික්‍රම රාජසිංහ'' නමින් බලයට පත් කළ උඩරට රදල ප්‍රධානියා,
1. ඇහැලේපොල නිලමේ
2. මොල්ලිගොඩ අධිකාරම්
3. පිළිමතලාවේ මහඅධිකාරම්
4. මඩුගල්ලේ නිලමේ

(31) උඩරට බද්දේ සංවිධානය යටතේ වළං තැනීම සඳහා අයකළ බද්ද හැඳින්වූයේ,
1. රදා බද්ද
2. බඩහැල බද්ද
3. කුරුවේ බද්ද
4. ඇඟ බද්ද

(32) මහනුවර රාජධානි සමයේ ඉඩම් භුක්ති ක්‍රම යටතේ ගම්වැසියන් පාරම්පරිකව භුක්ති විඳි ඉඩම හැඳින්වූයේ,
1. ගබඩා ඉඩම්
2. විහාර ගම්
3. පරවේනි ඉඩම්
4. නින්දගම්

★ පහත දක්වා ඇති නිපැයුම් අධ්‍යයනය කර 33 - 37 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A ජල රාමුව
B දුම්රිය එන්ජිම
C මැකඩම් ක්‍රමය
D දුවන නඩාව

(33) ඉහත දක්වා ඇති පිළිතුරු අතුරින් පේෂ කර්මාන්තය හා සම්බන්ධ නිපැයුම් ඇතුළත් පිළිතුර තෝරන්න.
1. AB
2. AD
3. AC
4. BC

(34) ඉහත දැක්වෙන ඒවායින් ප්‍රවාහන ක්ෂේත්‍රය හා සම්බන්ධ නිපැයුම් ඇතුළත් පිළිතුර තෝරන්න.
1. AB
2. BC
3. CD
4. BD

**★ පහත සඳහන් වගුවේA සිට I දක්වා තොරතුරු ඇසුරෙන් 35 හා 36 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| **වර්ෂය** | **බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා** | **ඓතිහාසික සිදුවීම** |
|---|---|---|
| A. **1803** | D. **රොබට් බ්‍රවුන්රිග්** | G. **රාජකාරි ක්‍රමය අහෝසි කිරීම** |
| B. **1815** | E. **ෆෙඩ්රික් නෝර්ත්** | H. **උඩරට ආක්‍රමණය කිරීම** |
| C. **1848** | F. **වයිකවුන්ට් ටොරින්ටන්** | I. **නව බදු වර්ග හඳුන්වා දීම** |

(35) බ්‍රිතාන්‍ය උඩරට යටත්කරගැනීම පිළිබඳ තොරතුරු ඇතුළත් පිළිතුර කුමක්ද?
1. BDH
2. AEH
3. CDH
4. CDI

(36) ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවලට නව පාලන ක්‍රමයක් හඳුන්වා දුන් තොරතුරු ඇතුළත් පිළිතුර කුමක්ද?
1. AFI
2. AEG
3. BFG
4. CFI

**★ පහත තොරතුරු ඇසුරෙන් 37 සිට 39 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A. අනගාරික ධර්මපාලතුමා
බුද්ධගයාව බේරා ගැනීම

B. සිද්දි ලෙබ්බේ
උදයභානු පුවත්පත

C. මිෂනාරි ව්‍යාපාර
දේශීය ආගම්

D. මැනිං ප්‍රතිසංස්කරණ
මැනිං ආණ්ඩුකාරවරයා

(37) පළමු වැන්න නිසා දෙවැන්නේ පරිහානිය පෙන්වන පිළිතුර තෝරන්න.

1. A ය　　2. B ය　　3. C ය　　4. D ය

(38) පළමුවැන්න නිසා දෙවැන්නේ පැවැත්ම තහවුරුවන බව පෙන්වන පිළිතුර වන්නේ,

1. A ය　　2. B ය　　3. C ය　　4. D ය

(39) පළමුවැන්නත් දෙවැන්නත් අතර කිසිදු සම්බන්ධතාවයක් නොපෙන්වන යුගලය වන්නේ,

1. A ය　　2. B ය　　3. C ය　　4. D ය

(40) මුල්වරට සීමිත ඡන්දබලය හිමි වූ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය ලෙස සලකන්නේ,

1. කෝල්බෲක් කැමරන්
2. ඩොනමෝර් ප්‍රතිසංස්කරණ
3. කෲව් මැකලම් ප්‍රතිසංස්කරණ
4. මැනිං ඩෙවොන්ෂර් ප්‍රතිසංස්කරණ

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்**
Sabaragamuwa Provincial Department of Education

දෙවන වාර පරීක්ෂණය 2017
**மூன்றாம் தவணைப் பரீட்சை 2017**
**Second Term Test 2017**

11 ශ්‍රේණිය
**தரம்11**
**Grade 11**

ඉතිහාසය II
History **II**

පැය 3 යි
Three hours

★ **I වන කොටසේ පළමුවැනි ප්‍රශ්නය අනිවාර්ය වේ.**
★ **II වන කොටසින් ප්‍රශ්න හතරකට ද III කොටසින් ප්‍රශ්න එකකටද පිළිතුරු සපයන්න.**
★ **පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.**

## I කොටස

**(01) (අ) පහත I යටතේ දක්වා ඇති ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහිද II යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියමේ ද ලකුණු කර නම් කරන්න.**

i. මහාතිත්ථ , පාහියංගල , පොළොන්නරුව , සීතාවක , ඉරණමඩුව, හුරුළු වැව , කලා ඔය , මහනුවර, මිහිභාගල්කන්ද , ගෝකණ්ණතිත්ථ , අලිගල

ii. එංගලන්තය , නාගසාකි , රෝමය , කොන්ස්තන්තිනෝපල් , බතාවිය , මධ්‍යධරණී මුහුද

(ආ) i. පහත A B C D යටතේ දක්වා ඇති තොරතුරු හා සම්බන්ධ පුද්ගලයින් අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A. ක්‍රි.ව. 1818 නිදහස් යටතේ සිංහාසනයට හිමිකමක් ඇතැයි පවසා නායකත්වය දුන් පුද්ගලයාගේ හිමිකම ව්‍යාජ එකක් යැයි පසුව තීරණය විය. එලෙස ව්‍යාජ හිමිකමක් දක්වමින් 1818 යටතට නායකත්වය දුන් පුද්ගලයා,

B. ක්‍රි.ව. 1918 දී පිහිට වූ ලංකා ජාතික සංගමයේ ප්‍රථම සභාපතිවරයා.

C. 20 වන සියවසේ නාගරික කම්කරුවන්ට තම අයිතිවාසිකම් දිනා ගැනීමේ සටනට නායකත්වය දුන් දේශීය නායකයා

D. ලංකාවේ ප්‍රථම නාමික විධායක ජනාධිපති (ලකුණු 04)

**A සහ B යටතේ ඇති පිංතූර අධ්‍යයනය කර අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු අනුපිළිවෙළින් ලියන්න.**

(II) i. A වලින් දැක්වෙන රූපය නම් කරන්න.
ii. එය පිහිටා ඇති පූජනීය ස්ථානය ලියන්න.
iii. එම ස්ථානය ඉදිකරන ලද්දේ කිනම් රජ කෙනෙකු වෙනුවෙන්ද?
iv. එය පිහිටි නගරය ලියන්න.


A රූපය

(ලකුණු 04)

(III) i. B වලින් දැක්වෙන රූපය නම් කරන්න.
ii. එය නිපදවූයේ කවුද?
iii. ඔහු කුමන ජාතිකයෙක්ද?
iv. මෙය කුමන ක්ෂේත්‍රය හා සම්බන්ධ ද?


B රූපය

(ලකුණු 04)

## II කොටස

(02) i. ප්‍රාග් ඓතිහාසික මානවයා වාසය කළ පරිසර කලාප 3ක් ලියා දක්වන්න. (ල.03)

ii. ප්‍රාග් ඓතිහාසික මානවයා වාසය කළ වාසස්ථාන අනුව වෙරළාශ්‍රිත එළිමහන් කඳවුරු දෙකක් ද කඳුකර එළිමහන් දඩයම් ස්ථාන දෙකක්ද නම් කරන්න. (ල.04)

iii. ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගයේ ජීවන රටාව කරුණු දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ල.05)

iv. ශ්‍රී ලංකාවේ පූර්ව රාජ්‍ය සමයේ පරිපාලන ව්‍යුහය උදාහරණ තුනක් ඇසුරෙන් විස්තර කරන්න. (ල.06)

(03) i. දේශපාලන බලය මධ්‍යගත වීමේදී විවිධ රාජ්‍යත්ව සංකල්ප බිහිවිය. එසේ බිහිවූ රාජ්‍යත්ව සංකල්ප තුනක් සඳහන් කරන්න. (ල.03)

ii. ශ්‍රී ලංකාවේ රාජ්‍ය උරුමය ලැබෙන ආකාර දෙක සඳහන් කරන්න. (ල.04)

iii. මෙරට පාලනය කළ ශ්‍රේෂ්ඨ රජවරු දෙදෙනෙකු වන දුටුගැමුණු හා වසභ රජවරුන්ගේ සේවාවන් පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.05)

iv. මෙරට පැරණි සමාජයේ ආර්ථිකය කරුණු තුනක් ඇසුරෙන් විස්තර කරන්න. (ල.06)

(04) i. පහත සඳහන් වැව් කරවන ලද රජවරුන් කවුරුන්දැයි අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A - මින්නේරිය වැව

B බසවක්කු-ලම වැව

C - කලා වැව (ල.03)

ii. අපේ රටේ පැරණි ජනයා ජලය රැක ගැනීම සඳහා යොදාගත් උපක්‍රම දෙකක් සඳහන් කරන්න. (ල.04)

iii. ශ්‍රී ලංකාවේ පුරාණ යකඩ නිස්සාරණ තාක්ෂණය ඉතා දියුණු මට්ටමක පැවති බව කරුණු දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ල.05)

iv. ඓතිහාසික යුගයේ මෙරට සමාජ සංවිධානය සැකසී තිබූ ආකාරය කරුණු තුනක් ඇසුරෙන් විස්තර කරන්න. (ල.05)

(05) i. ශ්‍රී ලංකාවේ දෙවන නාගරීකරණය යටතේ ඇති වූ පාලන මධ්‍යස්ථාන තුනක් ලියා දක්වන්න. (ල.03)

ii. පොළොන්නරුව රාජධානිය බිඳවැටීමට බලපෑ කරුණු දෙකක් සඳහන් කරන්න. (ල.04)

iii. කෝට්ටේ රාජධානිය එක්සත් කිරීමේදී හයවන පරාක්‍රමබාහු රජු අනුගමනය කළ ක්‍රියාමාර්ග දෙකක් සැකෙවින් විස්තර කරන්න. (ල.05)

iv. රජරට බිඳ වැටීමෙන් පසු රාජධානි නිරිත දිගට විතැන් වීමත් සමග ආර්ථිකයේ ඇති වූ වෙනස්කම් කරුණු තුනක් ඇසුරෙන් විස්තර කරන්න. (ල.06)

(06) i. ක්‍රි.ව. 1521 දී සිදු වූ විජයබා කොල්ලයෙන් පසු කෝට්ටේ රාජධානිය බෙදීගිය කොටස් තුන නම් කරන්න. (ල.03)

ii. පෘතුගීසීන් යාපනය රාජධානිය කෙරෙහි අවධානය යොමු කිරීමට බලපෑ කරුණු දෙකක් සඳහන් කරන්න. (ල.04)

iii. කොතෙක් උත්සාහ කළද පෘතුගීසීන්ට උඩරට රාජ්‍යයේ බලය තහවුරු කර ගැනීමට නොහැකි විය. එයට බලපාන ලද කරුණු දෙකක් සඳහන් කොට ඒවා පැහැදිලි කරන්න. (ල.05)

iv. උඩරට රාජ්‍ය සම්බන්ධයෙන් ලන්දේසීන්ගේ ප්‍රතිපත්තිවල කැපී පෙනෙන ලක්ෂණ කරුණු තුනක් ඇසුරෙන් විස්තර කරන්න. (ල.06)

(07) i. පහත සඳහන් සිදුවීම් සම්බන්ධ පුද්ලගලයින් A, B, C අනුපිළිවෙලට ලියන්න.

A - ක්‍රි.ව. 1803 දී නෝර්ත් පාලන සමයේ උඩරට ආක්‍රමණය මෙහෙය වූ සෙන්පතියා

B - 1848 කැරැල්ලේදී රජු බවට ප්‍රකාශ කල පුද්ගලයා

C - ක්‍රිස්තියානි පූජකයන්ට විරුද්ධව පානදුරාවාදය මෙහෙය වූ භික්ෂූන් වහන්සේ. (ල.03)

ii. බ්‍රිතාන්‍ය පාලන සමයේ හින්දු හා ඉස්ලාම් පුනර්ජීවනයට නායකත්වය දුන් නායකයින් දෙදෙනෙකු බැගින් සඳහන් කරන්න. (ල.04)

iii. 1818 නිදහස් සටන ඇති වීමට බලපෑ හේතු දෙකක් ලියා ඒවා කෙටියෙන් විස්තර කරන්න. (ල.05)

iv. ජනතාව තුළ බෞද්ධ පුනර්ජීවනය ඇති කිරීමෙහිලා ඕල්කට්තුමා , කැපවූ ආකාරය නිදසුන් තුනක් ඇසුරෙන් විස්තර කරන්න. (ල.06)

## III කොටස

(08) i. යුරෝපයේ ඇති වූ පුනරුදයත් සමඟ දේශගවේෂණ ව්‍යාපාරය ආරම්භ විය. එහිදි පහත සඳහන් ප්‍රදේශ සොයාගත් පුද්ගලයින් නම් කරන්න. (ල.03)

A - බටහිර ඉන්දීය දූපත්

B - කැනඩාව

C - පිලිපීනය

ii. පුනරුදය ඇති වීමට බලපෑ හේතු දෙකක් ලියා දක්වන්න. (ල.04)

iii. පුනරුදයේ නව සොයා ගැනීම නිසා දේශගවේෂණ ව්‍යාපාරය පහසු විය. එය කරුණු දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ල.06)

iv. පුනරුදය ශ්‍රී ලංකාව කෙරෙහි සිදුකළ බලපෑම කරුණු තුනක් ඇසුරෙන් විස්තර කරන්න. (ල.05)

(09) i. කාර්මික විප්ලවය මුලින් ම ආරම්භ වූ ක්ෂේත්‍ර තුන නම් කරන්න. (ල.03)

ii. කාර්මික විප්ලවය බ්‍රිතාන්‍යයේ ආරම්භ වීමට බලපෑ හේතු දෙකක් සඳහන් කරන්න. (ල.04)

iii. කාර්මික විප්ලවය 19 වන සියවසේ දී වෙනත් යුරෝපා රටවලට ව්‍යාප්ත වීමට බලපෑ හේතු දෙකක් දක්වා ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.06)

iv. කාර්මික විප්ලවය නිසා සන්නිවේදන ක්ෂේත්‍රයේ ඇති වූ දියුණුව කරුණු තුනක් ඇසුරින් විස්තර කරන්න. (ල.05)

**දෙවන වාර පරීක්ෂණය - 2017** **11 ශ්‍රේණිය**

**ඉතිහාසය I පිළිතුරු**

| | | | |
|---|---|---|---|
| 1) 11 | 11) 4 | 21) 3 | 31) 2 |
| 2) 3 | 12) 1 | 22) 3 | 32) 3 |
| 3) 2 | 13) 3 | 23) 3 | 33) 2 |
| 4) 2 | 14) 1 | 24) 2 | 34) 2 |
| 5) 3 | 15) 1 | 25) 1 | 35) 1 |
| 6) 3 | 16) 4 | 26) 3 | 36) 2 |
| 7) 3 | 17) 4 | 27) 1 | 37) 3 |
| 8) 4 | 18) 1 | 28) 3 | 38) 1 |
| 9) 3 | 19) 3 | 29) 3 | 39) 2 |
| 10) 3 | 20) 1 | 30) 2 | 40) 3 |

(ලකුණු 2 x 40 = 80)

# ඉතිහාසය
# II පත්‍රය - පිළිතුරු

(01) **(ආ)** A දොරේසාමි
B පොන්නම්බලම් රාමනාදන්
C ඒ.ඊ. ගුණසිංහ
D විලියම් ගොපල්ලව

(II) i. දැදිගම ඇත් පහන
ii. දැදිගම සූතිඝර චෛත්‍යය
iii. 1 වන පරාක්‍රමබාහු රජු / මහා පරාක්‍රමබාහු රජු
iv. දැදිගම

(III) i. මෝටර් රථය
ii. ඩෙම්ලර්
iii. ජර්මන්
iv. ප්‍රවාහන ක්ෂේත්‍රය

## II කොටස

(02) i.
- ⋆ පහතරට ශුෂ්ක කලාපය
- ⋆ පහතරට අර්ධ ශුෂ්ක කලාපය
- ⋆ පහතරට වියළි කලාපය
- ⋆ පහතරට අතරමැදි වියළි කලිපය

ii. **<u>වෛරළාශ්‍රිත කඳවුරු</u>** | **<u>කඳුකර එළිමහන් දඩයම් භූමි</u>**

- ⋆ මිනිහාගල් කන්ද
- ⋆ බූන්දල
- ⋆ පතිරාජවෙල

- ⋆ බණ්ඩාරවෙල
- ⋆ හෝර්ටන්තැන්න.

iii.
- ⋆ ක්‍රමවත් සුසාන භූමි
- ⋆ ස්ථිර නිවාස
- ⋆ මැටි වළං භාවිතය
- ⋆ මැටි පබළු භාවිතය
- ⋆ කාන්තා ඇස් අඳුන් ගල්වන භාවිතය
- ⋆ ගුරුගල් භාවිතකොට සිරුර වර්ණ ගැන්වීම

iv.
- ⋆ ප්‍රාදේශීය පාලනයක් පැවතීම (පරුමක)
- ⋆ ගම් නායකයෙක් සිටීම (ගමික)
- ⋆ ගමේ පොදු වැඩවලදී ගමිකයෙග් මූලිකත්වය ගැනීම
- ⋆ පොචනි රජ දූපත යනුවෙන් ප්‍රාදේශීය පාලකයන් වීම

(03) i. දේවත්වය , බෝධිසත්ව , වීරත්වය , චක්‍රවර්තී

ii. පියාගෙන් පුතාට
සහෝදරයාගේ සහෝදරයාට

iii. දුටුගැමුණු රජු - රට එක්සත් කිරීම
එළාරගෙන් රට බේරා ගැනීම
ශාසනික සේවා ඉටු කිරීම

වසභ රජු - විශාල වැව් තැනීම ආරම්භ කිරීම
වැව් දහසක් ඉදි කිරීම
බෞද්ධ වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය

iv. ⋆ කෘෂිකර්මය - හේන් වගාව , වී වගාව
⋆ කර්මාන්ත
⋆ වෙළඳාම

(04) i. A මහසෙන් රජු
B පණ්ඩුකාභය රජු
C ධාතුසේන රජු

ii. ⋆ ගම්වැව් තැනීම , මහවැව් තැනීම , වැව් පද්ධතියක් නිර්මාණය කිරීම
⋆ ජලයට බදු අය කිරීම , වැව් පාලනයට නිලධාරියෙකු පත්කොට සිටීම.

iii. ⋆ ඌව පලාතේ බෙරගල ගමෙන් යබොර කැබැල්ලක් සොයා ගැනීම
⋆ සමනල වැව හා අලකොල වැව නිස්සාරණ උඳුන් සොයා ගැනීම
⋆ ස්වභාවික සුළං ධාරා යොදා ගැනීම. ඉන්ධනයක් ලෙස ''යකඩ මරං'' ගස් භාවිත කිරීම.
⋆ මයිනහමක් යොදා උඳුන දැල්වීම (සීගිරිය අලකොල වැව)

iv. ⋆ ඉහළින් සිටින්නේ රජුය.
⋆ රජු සමීපයේ රදළයින් කටයුතු කරන ලදි. ඔවුන් රාජකීය නිලධාරීන් විය
⋆ මහා සංඝරත්නය රජුට අනුශාසනා කරන ලදි.
⋆ වෙළෙඳුන් වෛද්‍යවරු, ගුරුවරු , ගොවියන් ආදි විවිධ වෘත්තිකයන් විය.
⋆ සාමාන්‍ය ජනයා ''කුඩීන්'' ලෙස හඳුන්වන ලදි.
⋆ පහත්ම ස්ථරය දාසයින් ය.
  ⋆ පාරම්පරික දාසයින් - අන්වාතදාසි''
  ⋆ කුලියට ගත් දාසයින් ''ධනක්කීත දාස''

(05) i. දඹදෙනිය , යාපහුව , කුරුණෑගල , ගම්පල , කෝට්ටේ , මහනුවර , සීතිවක

ii. ⋆ දුර්වල පාලකයින් බලයට පත්වීම
⋆ කාලිංග මාඝ ආක්‍රමණ
⋆ කාලිංග හා පාණ්ඩ්‍ය වංශීන් අතර බල අරගල
⋆ ආර්ථික පරිහානිය

iii. ⋆ වන්නි ප්‍රදේශ ඈඳා ගැනීම
⋆ යාපනය යටත් කර ගැනීම
⋆ උඩරට සිටුවරයාගේ කැරැල්ල මර්ධනය කොට උඩරට ඈඳා ගැනීම

iv. ⋆ වාණිජ ආර්ථිකයට යොමු වීම
⋆ කෘෂිකර්මාන්තයට අහස් දිය යොදා ගැනීම
⋆ කුළුබඩු වෙළඳාම
⋆ කුරුඳු ප්‍රධාන වෙළඳ බෝගය වීම
⋆ මුතු මැණික් ඇතුළු ඇත්දල වෙළඳාම
⋆ විදේශ වෙළඳාම දියුණු මට්ටමක පැවතීම
⋆ ගම්පොල රාජධානි සමයේ මෙරටට ඉබන් බතුතාගේ වාර්තාවල ද දියුණු වෙළඳාමක් පැවති බවට සාක්ෂි ඇත.

(06) i. ⋆ කෝට්ටේ
⋆ රයිගම
⋆ සීතාවක

ii. ⋆ උතුරේ වරායන් ලබා ගැනීමට
⋆ ආගම ප්‍රචාරය කිරීම සඳහා

iii. ⋆ උඩරට රජවරුන් බලවත් වීම
⋆ ස්වභාවික රැකවරණය
⋆ ජනතාව රජුට දක්වන ලද පක්ෂපාතී බව
⋆ ගරිල්ලා සටන් ක්‍රමය

iv. ⋆ ගැටුම්වලින් තොරව සාමාකාමීව කටයුතු කිරීම
⋆ උඩරට රජුගේ හොඳහිත යොදා ගැනීම
⋆ උපසම්පදාව ගෙන ඒම සඳහා නැව් ලබා දීම
⋆ උඩරට වැවෙන කුරුඳු තමන් වෙත ලබා ගැනීම
⋆ රජුට පක්ෂපාතී බව පෙන්වා උපරිම ආර්ථික වාසි ලබා ගැනීම

(07) i. A මැක්ඩොවෙල්
B ගොංගාලේ ගොඩබණ්ඩා
C මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි

ii. හින්දු - ආරුමුගනාවලර්
පොන්නම්බලම් රාමනාදන්
පොන්නම්බලම් අරුනාචලම්-

ඉස්ලාම් -සිද්ධි ලෙබ්බේ
ටී.බී. ජයා

iii. ⋆ රජෙකු අහිමි වීම පිලිබඳ පසුතැවිල්ල
⋆ බුදුදහම නොසලකා හැරීම
⋆ උඩරට රදළයන්ට පහර වැදීම
⋆ උඩරට සම්ප්‍රදාය කඩ කිරීම (හජ්ජි මරික්කාර් පත් කිරීම)

iv. ⋆ පරම විඥාර්ථ බෞද්ධ සමාගම පිහිටුවීම
⋆ බෞද්ධ පාසල් පිහිටුවීම
⋆ පොහොය දිනය නිවාඩු දිනයක් බවට පත් කිරීම
⋆ බෞද්ධ කොඩිය නිර්මාණය කිරීම

## III කොටස

(08) i. A ක්‍රිස්ටෝපර් කෙලොම්බස්
B කැබේ සහෝදරයෝ
C පර්ඩිනන්ඩ් මැගලන්

ii. ⋆ 1453 දී කොන්ස්තන්තිනෝපලය තුර්කීන් අතට පත් වීම
⋆ වෙළඳාම දියුණු වීම හා නව ධනවතුන් පිරිසක් බිහිවීම
⋆ බුද්ධි ප්‍රබෝධය
⋆ පල්ලියේ ආධිපත්‍යය විවේචනය කිරීම

iii. ⋆ මාලිමා යන්ත්‍රය , උතුරු තරු මාපකය නිපදවීම
⋆ පෘථිවිය ගෝලාකාර බව සොයා ගැනීම
⋆ ටොලමිගේ ලෝක සිතියම
⋆ ජාතික රාජ්‍ය මගින් දේශගවේෂණ සඳහා අනුග්‍රහ දැක්වීම

iv. ⋆ දේශපාලනික - පෘතිගීසි , ලන්දේසි , ඉංග්‍රිසි පාලන ක්‍රම හඳුන්වා දීම.

⋆ ආර්ථික - ⋆ වෙළඳාම දියුණු වීම
⋆ වතුවගා ආරම්භ කිරීම
⋆ ස්වයං පෝෂිත ආර්ථික ක්‍රමය බිඳ වැටීම
⋆ ආනයන අපනයන ආර්ථිකයක් බිහිවීම
⋆ වෙළඳ නගර බිහිවීම

⋆ සමාජ සංස්කෘතික - ⋆ අධ්‍යාපනය දියුණු වීම
⋆ ආගම ප්‍රචාරණය
⋆ බටහිර සංස්කෘතිය ප්‍රචලිත වීම
⋆ ගොඩනැගිලි කලාව වෙනස් වීම

(10) i. පේෂ කර්මාන්තය , ගල් අඟුරු කර්මාන්තය , යකඩ හා වානේ කර්මාන්තය

ii. ⋆ ධනවතුන් පිරිසක් සිටීම
⋆ දේශපාලන ස්ථාවරය
⋆ ජනගහනය අධික වීම
⋆ අවශ්‍ය තරම් අමුද්‍රව්‍ය තිබීම
⋆ වෙළඳාම දියුණු වීම
⋆ බුද්ධිමතුන් පිරිසක් සිටීම.

iii. ⋆ ලොව ජනගහනය ශීඝ්‍රයෙන් ව්‍යාප්තවීම හා භාණ්ඩවලට තිබූ ඉල්ලුම වැඩිවීම
⋆ යුරෝපය තුළ ගමනාගමනය හා ප්‍රවාහන කටයුතු වැඩ වර්ජනය
⋆ ප්‍රංශය හා ජර්මනිය ගල් අඟුරු සොයා ගැනීම

iv. ⋆ 1840 පෙනී තැපැල් සේවය
⋆ සැමුවෙල් මෝස් විදුලි පණිවිඩ සේවය
⋆ ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම්බෙල්ගේ දුරකථන
⋆ මාර්කෝනිගේ ගුවන් විදුලිය
⋆ ජෝන් ලොගී බෙයාර්ගේ රූපවාහිනිය

**(01) (අ)** i.



N
ඉරණමඩුව
මහාතිත්ථ
ගෝකණ්ණතිත්ථ
හුරුළුවැව
කලා ඔය
පොළොන්නරුව
අලිගල
මහනුවර
සීතාවක
පාහියන්ගල
මිනිහාගල්කන්ද

**(01) (ඇ)** ii.




N


SABARAGAMUWA PROVINCIAL EDUCATION DEPARTMENT
N